බොරු චෝදනා නැගීම යනු කුමක් දැ?යි මා නුඹලාට දන්වා සිටිය යුතු නොවේ ද! එනම් ජනයා අතර වාචාල ලෙස කේළාම් කීමය.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “බොරු චෝදනා නැගීම යනු කුමක් දැ?යි මා නුඹලාට දන්වා සිටිය යුතු නොවේ ද! එනම් ජනයා අතර වාචාල ලෙස කේළාම් කීමය.” [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

ජනයා අතර අර්බුද ඇති කරන පරිදි ඔවුන්ගෙන් ඇතැමෙකු ගැන විස්තර තවත් කෙනෙකු වෙත ගෙන යමින් ඔවුන් අතර කේළාම් කියා සැරිසැරීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා තම සමූහයාට අවවාද කිරීමට අපේක්ෂා කළේය. ඒ අනුව සිත් තුළ මැනවින් පතිත වන පරිදි ඒවා අවදි කරන පරිදි ඇරයුම් කරමින් ප්රශ්නාර්තයක ස්වරූපයෙන් නබි (සල්ලලාහු අලයිහි වසල්ලම්) තුමා මෙම හදීසය ආරම්භ කර ඇත. ඒ අනුව “බොරු චෝදනා නැගීම යනු කුමක්දැ?යි’ යනුවෙන් විමසා සිටියහ. එනම් අසත්යය හා බොරු ගෙතීම යනු කුමක් දැයි යන්නය. පසුව හූනියම ගැන විස්තර කරන ලදී. පසුව එම ප්රශ්නයට එතුමාම මෙසේ පිළිතුරු දුන්හ. බොරු චෝදනාව යනු ජනයා අතර වාදිත ප්රකාශ දන්වා සිටීමය. සැබැවින්ම එය හූනියම් කරු අර්බුධ ඇති කරන්නාක් මෙන් වූ ක්රියාවකි. ජනයා අතර දකින්නට ඇත්තාක් මෙන් ඔවුනට ඉන් හිංසාවන් ඇති කරයි. එකට ලෙන්ගතුකමින් වෙළුණු හදවත් තුළ බෙදීම් ඇති කරයි. සමීපතයින් අතර පවතින සම්බන්ධතා විසන්ධි කර දමයි. ක්රෝධයෙන් හා වෛරයෙන් හදවත් පුරවා දමයි.

https://sunnah.global/hadeeth/si/show/5942